



# මෝඩ ඉවාන්ගේ කතාන්දරය

මැක්සිම් ගෝර්කි



එකෝමත් එක රටක ඉවාන් කියල මෝඩයෙක් හිටියා. පෙනුම ලස්සනයි. ඒත් වෙන මිනිස්සු වගේ නොවෙයි. එයා මොනව කළත් අන්තිමට ඒක විහිළුවක් වෙනවා.

එක ගොවියෙක් එයා ගෙදර වැඩට බඳවා ගත්තා. දවසක් ගොවියා හාමිනේත් එක්ක නගරයට යන්න සූදානම් වුණා. හාමිනේ ඉවාන්ට කතා කරල කියනවා.

"උඹ ළමයි එක්ක ගෙදර නැවතියන්. ළමයින්ට කන්න බොන්න දීලා හොඳින් බලා ගන්න ඕනෑ. තේරුණාද?"



"මොනවද කන්න දෙන්නෙ?" ඉවාන් ඇහුවා.

"වතුරයි, අලයි, පිටි ටිකකුයි ගනින්. අලවල පිට සූරලා පිටිත් එක්ක වතුරට දමලා තම්බාපන්, හොඳ සුප් එකක් ලැබෙයි!" හාමිනේ උත්තර දුන්නා.

ඊට පස්සෙ ගොවියාත් ඉවාන්ට අණ කළා.

හොඳට ගෙදර මුර කරපන්. නැත්නම් ළමයි කැළේට පැනල යයි!"

ගොවියා හාමිනේත් එක්ක ගෙදරින් පිට වෙලා යන්න ගියා. ඉවාන් ළමයින් අවදි කරලා බිම වාඩි කෙරෙව්වා.



ඊට පස්සේ ළමයින්ට පිටුපසින් බිම වාඩිවෙලා කියනවා.

"ඕං දැන් ඉතින් මං ඔයාලා දිහා බලා ඉන්නවා හොඳද!"

ළමයි ටික වෙලාවක් බිම වාඩිවෙලා ඇදලා කන්න මොනවා හරි ඉල්ලුවා. ඉවාන් වතුර බාල්දියක් ගෙනැවිත්, පිටි ගෝනි බාගයකුයි, අල කූඩයකුයි ඒකට හලාලා වතුර ඇදිත කත් ලියෙන් ඒ ඔක්කොම එකට කලවම් කළා. ඊට පස්සෙ ශබ්ද නගා තනියම කතා කළා.

"දැන් මං කාගෙ පිට ද පූරන්නෙ?"

මේ කතාව අහල හොඳටම බයවුණ ළමයි දෙන්න හෙමින් සැරේ ගෙයින් එළියට පැනල කැළේට දිව්වා.



දුවන ළමයින් දිහා හිස අත් බැඳගෙන බලා සිටි ඉවාන් කල්පනා කරන්න පටන් ගත්තා.

"දැන් ඉතිං කොහොමද මං එයාලා දිහා බලා ඉන්නේ? ඒ මදිවට දොර මුර කරන්නත් එපායැ, නැත්නං ඒකත් පැනලා යයි!"

එහෙම හිතලා බාල්දියට කතා කරලා කියනවා.

"උඹ සූප් එක හොඳට තැම්බෙන්න ගිනට ගනින්. මං යනවා ළමයින් දිහා බලා ඉන්න!"

ඊට පස්සෙ දොර සරනේරුවලින් ගලවලා කර ගහගෙන වතාන්නගේ දිහාවට ඇවිදගෙන ගියා. හදිසියේම ඉවාන් ඉස්සරහට වලහෙක් ආවා.




වලහට හරි පුදුමයි.

"ඒයි, මොකද යකෝ, උඹ කරලේට ලෑල්ලක් කර ගහ ගෙන එන්නේ?" වලහා ගොරවමින් ප්‍රශ්න කළා.

ඉවාන් සම්පූර්ණ විස්තරේ වලහට කිවා. කකුල් දෙකින් බිම වාඩි වුණා. වලහා බක බක ගාලා මහා හයියෙන් හිනා වුණා.

"අනේ උඹ වගේ මෝඩයෙක්! මේ කරපු වැඩේට නම් මං උඹ අල්ලලා ගිලිනවා!" වලහා කීවා. එතකොට ඉවාන් කියනවා

"වඩා හරි ළමයින් දෙන්න අල්ලලා ගිලින එක තමයි. මොකද එතකොට ඊළඟ සැරේ එයාලා කරලේට පැනලා යන එකක් නැහැනේ. අම්මට තාත්තට කීකරු වෙලා ඉඳීවි"



වලහා තවත් ගඩියෙන් ගිනා වුණා. බිම පෙරැළී පෙරැළී ගිනා වුණා.

"මේ වගේ මෝඩයෙක් මං කවදාවත් දැකලා නෑ! වරෙන් යන්න. උඹ මගේ හාමිනේට පෙන්නන්න ඕනෑ.

වලහා ඉවාන් තමන්ගෙ ගුහාවට කැඳවාගෙන ගියා. ඉවාන් ඇවිද ගෙන යන කොට දොර ගස් වැල්වල ඇවටුණා.

"ඔන්න ඕක විසි කරලා දාපන්!" වලහා කීවා.

"බෑ, බෑ, මං කිව්වොත් කිව්වා. දොර මුරකරන්න පොරොන්දු වුණා. ඉතිං මුර කරන්න එපායැ!"

දෙන්නම ගුහාවට ආවා.



වලහා හාමිනේට කතා කරලා කියනවා.

"මාෂා, මෙන්න බලන්න මං එයාගේ ආව මෝඩයගේ හැටි! හරිම විහිළු කාරයෙක්!"

එතකොට ඉවාන් වලස්හාමිනේගෙන් අහනවා.

"නැන්දේ, ළමයින් එහෙම දැක්කේ නැද්ද?"


"මගේ ළමයිද්! අර ගෙදර ඉන්නෙ. ඒ ගොල්ල නිදි." වලස් හාමිනේ උත්තර දුන්නා.

"කෝ බලන්න, පෙන්නපන්කෝ. ඒ මගේ ළමයි ද දන්නේ නෑ?"

වලස්හාමිනේ ඉවාන්ට වලස් පැටව් තුන්දෙනෙක් පෙන්නුවා. එතකොට ඉවාන් කියනවා.

"නෑ මේ මගේ ළමයි නොවෙයි, මට හිටියේ දෙන්නයි."

එතකොට වලස්හාමිනේට තේරුණා ඉවාන් පල් මෝඩයෙක් බව.



ඈ හිනාවෙලා කියනවා. "ඉතින් උඹේ ළමයි මනුස්ස ළමයින් නොවැ!"

"මේ මොනවා කියනවද, මන්ද" ඉවාන් කිවා. "මේ තරම් පුංචි එවුන් කාගේ කවුද කියලා අඳුනා ගන්නේ කොහොමද?"

"මෙහෙමත් විහිළුකාරයෙක්!" වලස්හාමිනේ පුදුමයෙන් කිවා. ඈ ස්වාමිපුරුෂයාට කතා කරලා කියනවා.

"මීට අපි මෙයා මරාගෙන කන්නේ නැතුව අපේ වැඩකාරයා විදිහට තියා ගමු"

"මක් වෙනවද?" වලහා කැමති වුණා. "එයා මනුස්සයෙක් වුණාත් කිසිම කරදරයක් කරන කෙනෙක් නෙවෙයි!"

ඊට පස්සේ වලස්හාමිනේ ඉවාන්ට වේවැල් කූඩයක් දීලා කියනවා.

"පලයන්, ගිහින් ඇඹිල්ල ටිකක් කඩාගෙන වරෙන්. ළමයි නැගිට්ටම එයාලට රස කෑමක් දෙන්න ඕනෑ!"



"අපොයි, ඕක මොකක්ද, මට පුළුවන්" ඉවාන් කීවා. "හැබැයි මං එන තුරු හැන්ද, දෙර මුරකරන්න ඕනෑ!"

ඉවාන් ඇඹිල්ල කඩන්න ගියා. කූඩය පිරෙන්නම ඇඹිල්ල කඩා ගත්තා. එයත් බඩ පිරෙන්නම කෑවා. ආපසු එන ගමන් මහා හයියෙන් සිංදුවක් කීවා.

"අපොයි හරිම කම්මැලිය - වට රතු තිත් කුරුමිණියා.
බලතොත් වැඩ කරන රඟේ - හූනයි කූඹියයි අගේ"

ඉතිං ඔයහාම ඇවිදගෙන වලස් ගුහාවට ඇවිත් කෑ ගැහුවා.

"මෙන්න මං ඇඹිල්ල ගෙනාවෝ!"

වලස් පැටව් කූඩය ළඟට දුවගෙන ආවා. ඇවිදින් ගොරවන්නයි, එකිනෙකා තල්ලු කරමින් පොරකන්නයි, බඩ පිනුම් ගහන්නයි, හිටි පිනුම් ගහන්නයි පටන් ගත්තා.



වලස් පැටවුන්ට පුදුම සන්තෝසයක්! ඉවාන් උන් දිහා බලා ඉඳලා මෙහෙම කියනවා.

"ෂහ්, මටත් වලහෙක් වෙන්න බැරි වුණානේ. එහෙම නම් ඉතිං මටත් ළමයි ඉන්නවානේ!"

වලහයි, වලස්හාමිනෙයි බක බක ගාලා හිනා වුණා.

"අනේ අම්මප මෙහෙමත් මිනිහෙක්!" වලහා ගෙරෙව්වා.

"මේ යෝදයත් එක්ක නම් ජීවත් වෙන්න බෑ. අපට හිනාවෙලා මැරෙන්නයි වෙන්නෙ!"

"මේ අහන්න" ඉවාන් කියනවා: "ඔය දෙන්න මෙහේට වෙලා දොර මුර කරන්න. මං ළමයි ගැන හොයලා බලන්න යන්න ඕනෑ. නැත්නං මට හාමිපුතාගෙන් විපුමක් වෙන්නෙ නෑ."



එතකොට වලස්හාමිනේ වලහට කතා කරලා කියනවා.

"මීෂා, එයාගෙ උදව්වට ඔයත් ගියා නම් නේද හොඳ?"

"ඔව්, උදව් කරන්න ඕනෑ තමයි" වලහා ඒක අනුමත කළා.

"මිනිහා අපූරු විහිළු කාරයෙක් නොවැ!"

ඉතිං ඉවාන් වලහත් එක්ක කැලෑ පාරක් දිගේ ඇවිදගෙන ගියා. ඒ යන ගමන් දෙන්න බොහොම සුහදව කතා බහ කළා.

"උඹ ඇත්තටම හරි මෝඩයි නේ!" වලහා පුදුමයෙන් කිවා.

"එතකොට උඹ! ඥානවන්තයෙක්ද?" ඉවාන් ඇහුවා.

"මම ද?"

"ඔව්, උඹ තමයි!"

"මං දන්නේ නෑ." වලහා උත්තර දුන්නා.



"මමත් දන්නේ නෑ. එතකොට උඹ නපුරුද?" ඉවාන් ඇහුවා.

"නෑ මොකට නපුරු වෙනවද?"

"මං හිතන විදිහට නපුරු කෙනා තමයි මෝඩ. මමත් නපුරු නෑ. ඒ කියන්නෙ අපි දෙන්නගෙන් කවුරුවත් මෝඩ නෑ!"

"බලාපල්ලාකො තර්ක කරන අපූරුව! වලහා පුදුමයට පත් වුණා.

ඔන්න ඔහොම කතා කර කර යන කොට එක පාරටම පඳුරක් යට ළමයි දෙන්නෙක් නිදා ගෙන ඉන්නවා දැක්කා.

"අර ඉන්නෙ උඹේ ළමයි ද?" වලහා ඇහුවා.

"මං දන්නෙ නෑ." ඉවාන් උත්තර දෙනවා. "අහල බලන්න ඕනෑ මගේ ළමයි හිටියේ බෑගින්නෙ."



ඉවාන් ළමයින් අමදි කරල ප්‍රශ්න කළා.

"ඔයාලට බඩගිනිද?"

"හොඳටෝම බඩගිනියි!" ළමයි කෑ ගැහුවා.

"හරි." ඉවාන් කිව්වා. "ඒ කියන්නෙ මේ මගේ ළමයි තමයි."

"දැන් ඉතින් මං මේ ළමයින් ගමට එක්කරගෙන යන්න එපායැ. ඒ අතර උඹට පුළුවන්නෙ මාමේ දොර අරන් එන්න නේද. මට ඒකට විවේකයක් නෑ. මොකද මට ඉතිං තව සුප් එක උයන්නත් තියනවනෙ!"



"ඔය ඉතින් මහ වැඩක් යැ!" වලහා කිවා. "මම අරන් එන්නම් කො!"

ඉවාන් ළමයින් එක්ක ආපහු ගෙදර එනවා. ළමයි ඉස්සරහින්, ඉවාන් පිටුපස්සෙන් ළමයින් දිහා බලාගෙනම අඩිය තියනවා. ඉවාන්ට අහා කරල තිබුනෙ එහෙමයි. ඔය විදිහට ඇවිදගෙන එන අතර ඉවාන් සිංදුවක් කිවා.

"මෙන්න බොලේ මෙහෙමත් සෝලං - හාවකු කුරුමිණියෝ ඇල්ලනවෝ!
නරියා පඳුරක් යටට වෙලා - බලා ඉන්නවා පුදුම වෙලා."



ඉවාන් ආපහු ගෙදර එන්න කලින් හාම්පුතාලා නගරෙ ඉඳලා ආපහු ආවා. ඇවිල්ල බැලුවම ගේ මැද වතුර බාල්දියක්. වතුරට අලයි, පිටියි දමලා කලවම් කරලා! ළමයි ආ ගිය අතක් නෑ! දරුවට මොනවා වුණාද දන්නෙ නෑ. දෙන්නා බංකුවක් උඩ වාඩි වෙලා බොහොම දුකින් අඬ අඬා හිටියා.

"ඇයි මේ ඔබලා අඬන්නෙ?" ඉවාන් ඇහුවා.




එතකොටම ඒ දෙන්නට ළමයින් දකින්න ලැබුණා. දෙන්නා බොහොම සතුටු වෙලා, ළමයින් වඩා ගත්තා.

ඊට පස්සේ සුප් බාල්දිය පෙන්නල ඉවාන්ගෙන් ප්‍රශ්න කළා.


"මේ මොකක්ද උඹ හදල තියෙන්නෙ?" "සුප් එකක් නොවැ!"

"මෙහෙමද සුප් හදන්නෙ?" "මං කොහොමද දන්නෙ සුප් හදන හැටි?"

"එතකොට උඹ දොරට මොකද කාලේ?" "ඒක දැන් ගෙනෙයි. ආ, අර ගෙනෙන්නෙ!"




හාම්පුතාලා, ජනේලයෙන් බැලුවා. වලහෙක් දෙරක් කර ගහ ගෙන පාර දිගේ එනවා. වලහා දැකලා මිනිස්සු හිස් ලූ ලූ අත පැනලා දුවනවා. සමහරු වහල උඩට නගිනවා. තවත් සමහරු ගස් උඩට නගිනවා. බල්ලෝ වැටවල්වලට උඩින් පැනලා දුවනවා!



ඒත් එක නිර්භීත රතු කුකුළෙක් විතරයි තනියම පාර මැදට වෙලා වලහට බනින්න පටන් ගත්තා.

"අල්ලල ගගට දාන වෝ-ඕ......"




මෝඩ ඉවාන්ගේ සහෝදරයා
රුසියානු ජන කතාවක් ඇසුරින්
මැක්සිම් ගෝර්කි විසින් ළමයින් සඳහා ප්‍රතිනිර්මාණය
කරන ලදී
චිත්‍ර
ටී. සොබියෙරොවා
පරිවර්තනය රුසියන් බසින් සිංහල බසට
එච්. ජයරත්න
සිංහල මුද්‍රණයේ අකුරු සහ චිත්‍ර සැකසුම
අනුෂ්කා මල්ලිකාරච්චි
මුද්‍රණය
රංජි ප්‍රින්ටර්ස්, 506, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.

ප්‍රකාශනය
සීදු සුරුලු පොත් ප්‍රකාශන සමාගම

ISBN 955-591-086-3


මිල රු. 150/-